

# කාන්තා දිනය හා අපේ කාන්තාව

## ලියා දන්වන වග යි

මාර්තු 8 ජාත්‍යන්තර කාන්තා දිනය කාන්තාවන්ට පමණක් නොව සමස්ත සමාජයටම වැදගත් දිනයකි. එම දිනය නම්කොට එයට වසර සියයක් පිරීම ගැන කතා කිරීමට පළමුව එහි ඉතිහාසය ගැන දැනගැනීම වැදගත් ය.

1857 මාර්තු 8 වන දා ඇමරිකාවේ ඇඟලුම් කම්හලක කාන්තාවන් පිරිසක් තම වෘත්තිය අයිතිවාසිකම් උදෙසා ප්‍රථම වරට සංවිධානාත්මකව සිදු කළ විරෝධතා අරගලය පොලිස් පහරදීමකින් කෙළවර වුවත් එම දිනය ඓතිහාසිකව වැදගත් වූ බැවින් එය සිහිවීම පිණිස එවකට ජර්මන් කොමියුනිස්ට් පක්ෂයේ ජාත්‍යන්තර නායිකාවක වූ ක්ලාරා සෙට්කින් 1910 කෝපන්හේගන් නුවර පැවැත්වුණ සමාජවාදී කාන්තාවන්ගේ දෙවන සංවත්සරයට කරන ලද යෝජනාවක් අනුව මේ දිනය ජාත්‍යන්තර කාන්තා දිනය ලෙස සම්මත විය.

ඉන් වසර සියයක් ගතවී තිබුණද ලෝකයේ කෙසේ වෙතත් අපේ රටේ කාන්තාවන්ගේ අයිතීන් ගැන තවමත් අපට සෑහීමකට පත්විය හැකි ද? ලෝකයේ ප්‍රථම අගමැතිණී ප්‍රථම විධායක ජනාධිපති තනතුර දැරීම ඇරුණකොට අපේ රටේ කාන්තාවන් සමස්ත වශයෙන් දිනා ඇති අයිතීන් කොපමණ ද? ඊට සාපේක්ෂව කාන්තාවන් විඳින පීඩාවන් කොතෙක්ද? සමාජ ආකල්ප සිරිත් විරිත් ආර්ථික කොන්දේසි ආදී වශයෙන් විවිධාකාරයෙන් ඇය පීඩාවට පත් නොවන්නේ ද?

ලාංකීය සමාජය තුළ අධ්‍යපනයේදී හා රැකියාවේදී කාන්තාවනට සම තැන ලැබෙන බවට ව්‍යවස්ථාවෙන් සම්මත වී තිබුණද ප්‍රායෝගික තත්වය එසේ නොවන බව සමස්ථ සමාජයම අත්දැකීමෙන් දනියි. කාන්තාවන් වීම නිසාම මුහුණ දීමට සිදුවන ප්‍රශ්න වලදී ඇගේ සමාජ තරාතිරම රැකියාව ආර්ථික ශක්තිය යන කිසිදු හේතුවක් නිසා ඇය විඳින පීඩාව වෙනසක් සිදු නොවන බවට සමාජයම සාක්ෂි දරයි. එසේ වුවද කාන්තාවන් සමාජයට කරන මෙහෙවරද සුළු පටු නොවෙයි. අපේ රටේ වැඩිම විදේශ විනිමය උපයා දෙන ක්ෂෙත්‍රවල රැකියාවේ යෙදෙන්නේ කාන්තාවන් ය. ඇඟලුම් ක්ෂෙත්‍රයේ මෙන්ම මැදපෙරදිග රැකියා ක්ෂෙත්‍රයද මෙයට නිදසුන් ය. වැවිලි ක්ෂෙත්‍රය තුළද ඇගේ දායකත්වය සුළුපටු නොවේ. මේ සියළු ක්ෂෙත්‍ර වල වැඩි දායකත්වයක් ලබා දෙන ඇය ඊට සාපේක්ෂව ඉතා කෲර ලෙස ලිංගික හා ශ්‍රම සූරාකෑමකටද ලක්වන්නීය.

මෙය ඉතා කණගාටුදායක තත්වයකි. වසරක් පාසා කාන්තාවන්ගේ අයිතීන් ගැන සමරු සම්මන්ත්‍රණ පවත්වන නෝනා මහත්වරුන්ගේ අවධානය යොමුවිය යුත්තේ එයටය. පිළියම් යෙදිය යුත්තේ ද මෙවැනි ප්‍රශ්න වලටය. නැත්නම් අපට සිදුවන්නේ ව්‍යයස්ථාදායකයේ ඉහළම රැකියාවක යෙදෙන මහජන නියෝජිතවරියකගේ ඇහැක් දොට්ට පනින්නට පහර දුන් චූදිතයාට එරෙහිව නීතිය ක්‍රියාත්මක වූ ආකාරය වැනි සිදුවීම් දෙස විමතියෙන් බලා සිටින්නටය. පොලීසිය මේ සිදුවීමේදී කිවේ මේ ගැටුම ගෘහස්ථ ගැටුමක් බැවින් එය සමථයකට පත් කරන්නට උත්සාහ කරන බවය. වෙනත් ආකාරයකින් කියනවා නම් මේ සිදුවීම පෙළ පෙන්නුම් කළේ ගෘහස්ථ ගැටුමකදී බිරියට පහර දෙන්නට සැමියාට අයිතියක් ඇතැයි පොලීසිය අනියම් ආකාරයෙන් පිළිගන්නවා යන්න නොවේ ද? මෙවන් සමාජයක කාන්තාවට අයිති තැන රැක ගන්නට තවත් වසර සියයක් බලා සිටින්නට සිදුවන බව නම් සැකයක් නැත.

**සංස්කාරක**

### සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න අනන්‍යතාව හෙළි නොකර එවන ලිපි සඳහා පුවත්පතේ ඉඩක් නොලැබෙන බවද කරුණාවෙන් සළකන්න .



# හෙට දවසේ අධිකරණය

කේ.ඩබ්ලිව්.ජනරංජන

චන්දන කත්‍රිආරච්චි මහතාට එරෙහිව තිබු මිනීමැරුම් චෝදනා සම්බන්ධ නඩු විභාගය ඉදිරියට පවත්වාගෙන නොයන්නටත්, ඔහුට එරෙහිව ඇති බලවත් අපරාධ චෝදනා ඉවත් කරගන්නටත් නීතිපතිවරයා තීරණය කිරීම මාධය ක්ෂේත්‍රයේත් සමාජයේත් අවධානයක් දනාගත් සිදුවීමක් වූ බවක් පෙනෙන්නට නැත. කාලගුණ විපර්යාස හා ඊජිප්තුවේ නැගිටීම ගැන නොනැවතී කතා කරන බොහෝ මාධ්‍ය මෙවැනි සිදුවීම ගැන බැරෑරුම් ලෙස සාකච්ඡා නොකරයි. අධිකරණය අවසාන යුක්තිය ඉටු කරන දෙවොල විය යුතු ජනසමාජයක් තුළ මෙවැනි සිදුවීමක් පිළිබඳව දක්වන නිහඬතාව විසින් නැවත නැවතත් කියාපාන්නේ පුරවැසි සමාජයක් ලෙස අප, ස්වයංනිවටභාවයට පත්වීමේ ඛේදවාදකයේ තවත් පැතිකඩකි.

කත්‍රිආරච්චි මහතාගේ නිදහස් වීම ගැන මාධය සමාජයෙන්වත් දැඩි විරෝධයක් එල්ල නොවීමට හේතු වන කරුණු දෙකක් තිබේ. එකක් නම්, එය අධිකරණය කෙරෙහි වන විවේචනයක් සේ සැලකීමයි. අධිකරණය, විවේචනය නොකළ යුතු, එය කවර ආකාරයෙන් හැසිරුණද ඒ නොතකා වන්දනාමාන කළයුතු අස්පර්ශනීය කලාපයක් ලෙස දැකීම අප බොහෝ දෙනකු කැමැත්තෙන්ම තෝරා ගෙන ඇති මෙන්ම අපට හුරුපුරුදු කරද ඇති පිළිවෙතයි. එහෙත් අධිකරණය යනු රටේ ව්‍යවස්ථාදායක, විධායක යන ප්‍රධාන ආයතන දෙකම මෙන්, මහජනතාවගේ පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කරන තවත් එක් ආයතනයක් පමණෙකි. අධිකරණ මගින් ක්‍රියාත්මක කැරෙන අධිකරණ බලයේ පරම අයිතිකරු ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම දැක්වෙන්නේ, රටේ ජනතාවයි. ඒ නිසා තම පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කිරීමට භාරදී ඇති අධිකරණය හැසිරෙන්නේ කෙසේදැ'යි අවදියෙන් සිටින්නටත්, අවශ්‍ය විටක අගය කරන්නටත් එසේම විවේචනය කරන්නටත්, ඒ ගැන විරෝධය දක්වන්නටත් ජනතාවට පරම අයිතියක් තිබේ. (අධිකරණයට අපහාසයක් නොවන ලෙස) අධිකරණ තීන්දු විවේචනය නොකළ යුතුයැ'යි කෘත්‍රිම පිළිගැනීමක් මිස කිසිදු නෛතික තහනමක් නැත. සමාජයට වැදගත් ලෙස බලපාන අධිකරණ තීරණ ගැන බලවත් සංයුක්ත සමාජ සංවාද ඇතිවන තත්ත්වයක් ලෝකෙය් බොහෝ රටවල මෙන්ම අසල්වැසි ඉන්දියාවේද තිබේ. අවාසනාවකට අපේ රටේ අධිකරණ තීරණත්, එහි හැසිරීමත් එක් අතකින් ජනතාව විසින්ම ද, අනෙක් අතින් අධිකරණය විසින්මද පිළිගත් පුරුද්දක් පවත්වාගෙන යන බවක් පෙනෙයි. (එහෙත්, චන්දන කත්‍රිආරච්චි මහතා චෝදනාවලින් නිදහස් කිරීම අධිකරණය ගත් තීරණයක් නොවේ. අධිකරණය එම චෝදනා ගැන වසර 14ක් තිස්සේ නඩු විභාගයක් පවත්වාගෙන ආ අතර, සිදුවූයේ නඩුවේ පැමිණිල්ල මෙහෙයවන නීතිපතිවරයා විසින් චෝදනා ඉල්ලා අස් කර ගැනීමයි. නීතිපතිවරයා චෝදනා ඉල්ලා අස් කර ගන්නා විට අධිකරණයට කළ හැකි දෙයක් නොමැත.)

දෙවැනි කාරණය නම්, නීතිපතිවරයාට ජනාධිපතිවරයා සමග ඇති සම්බන්ධයයි. නීතිපතිවරයා යනු රජයේ කටයුතු සම්බන්ධයෙන් නීති උපදෙස් දෙන හා නීති නියෝජනය ලබාදෙන පුද්ගලයායි. එහෙත්, එසේ වූ පමණින් එයට ආණ්ඩුවේ අතකොලුවක් ලෙස ක්‍රියාකරන්නට ඉඩක් නැත. ජනජීවිතයට බලපාන පුළුල් නීතිමය කාරණා සම්බන්ධයෙන් ඔහු මැදිහත් වන බැවිනි. උදාහරණයක් ලෙස, සියලුම අපරාධ නඩුවලදී මහාධිකරණයේ අධිචෝදනා ගොනුකරන්නේ නීතිපතිවරයා විසිනි. මේ කාර්යය ඉටුකිරීමේදී ඔහු අත්‍යන්තයෙන්ම ස්වාධීන පුද්ගලයකු ලෙස කටයුතු කළ යුතුය. නීතිපතිවරයා ස්වාධීනව තැබීම සඳහා 17 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ, ඔහුගේ පත්වීම එවකට පැවැති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මැදිහත්වීම මත කළ යුතුයැ'යි විධිවිධාන සලසා තිබිණි) නීතිපතිවරයා ස්වාධීන නොවන විට සිදුවිය හැකි සරල එහෙත් අතිභයානක අපචාරය නම්, දේශපාලන හේතු මත හෝ බලය පිළිබඳ වෙනයම් බැඳීම් මත, අපරාධ චෝදනා නැගිය යුතු අයට එරෙහිව චෝදනා නොනැගීම හා චෝදනා නොනැගිය යුතු අයට එරෙහිව අපරාධ චෝදනා නැගීමයි.

ඉතිහාසය මුළුල්ලේම අධිකරණ අමාත්‍යාංශය යටතේ පැවති නීතිපති දෙපාර්තමේන්තුව පසුගිය අමාත්‍ය මණ්ඩල සංශෝධනයේදී තම විෂය පථයට අයත් ආයතනයක් ලෙස ජනාධිපතිවරයා විසින් නම් කරන ලදී. ඒ අවස්ථාවේදී පැන නැගුණු තර්කයක් වූයේ ජනාධිපතිවරයා තමන්ට වුවමනා ආකාරයෙන් නීතිපති දෙපාර්තමේන්තුව මෙහෙයවන්නට මෙයින් අවසර ලබාගනු ඇත යන්නයි. (අධිකරණ අමාත්‍යාංශය යටතේ තිබූ පමණින් එවැන්නක් නොවෙති'යි ඉන් අදහස් නොවේ) දැන් වැඩ සිදුවෙමින් පවතින්නේ එම පූර්ව නිගමනය සනාථ වන ආකාරයෙනි. ඊට එක් ප්‍රසිද්ධ සාධකයක් වන්නේ මහනුවර දිස්ත්‍රික් මන්ත්‍රී අබ්දුල් කාදර් මහතා ඔහුට එරෙහිව තිබූ සමෘද්ධි මුදල් වංචා නඩුවේ චෝදනාවලින් නිදහස් කිරීමයි. එය කරන ලද්දේ

41 වන පිටට

සන්නස
නව සහශ්‍රයට
SANNASA

**Sannasa**
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**උපදේශක සංස්කාරක / Advisory Editor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**සේයා රූ / Photography**
ප්‍රසන්න කුරුකුලරත්න Prasanna Kurukularatna

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**SA**
Chandra Eeriyagama
08 8331 2318

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**ACT**
Asoka Nimalasiri
0400 429 031